**ශීර්ෂය 302 - සමුපකාර සේවක කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 302 - සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූනි 03 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

----------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම්**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

සමුපකාර කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 15.24 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 14.26 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 0.98 ක් හෙවත් සියයට 6.43 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි .විස්තර පහත දැක්වේ .

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 14.10 | 13.27 | 0.83 | 5.89 |
| මූලධන | 1.14 | 0.99 | 0.15 | 13.16 |
| **එකතුව** | **15.24** | **14.26** | **0.98** | **6.43** |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාළ විෂය අංක 30201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන |
| 1.59 | 0.35 | 0.39 | 0.57 | 5.00 | 1.73 |

**2.3 අග්‍රිම ගිණුම්**

කොමිෂන් සභාව යටතේ වූ අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.12,878 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

සමූපකාර සේවක කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1. විසර්ජන ගිණුම**

**3.1.1 අයවැය විචලනය**

වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ගෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 ක සිට සියයට 58 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.2 කාර්යසාධනය**

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණය පහත දැක්වේ.

සමූපකාර සේවකයින් සඳහා නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම 2006 වර්ෂයේ යෝජිත ප්‍රධාන කාර්යයක් වූවද, 2016 ජූලි 31 දින වන විටත් එම කාර්යය ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

## 3.3 විසඳා නොතිබූ විගණන ඡේද

කොමිෂන් සභාවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු පහත සඳහන් විගණන ඡේද සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු නිමකර නොතිබුණි.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2014 | 6 | විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක නොකිරීම. |
| 2014 | 6 | සේවක පුරප්පාඩු නොපිරවීම හා ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් නොකිරීම. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 01 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 14 | 09 | 05 |
| (iii) | ද්විතියික මට්ටම | 06 | 04 | 02 |
| | **එකතුව** | **23** | **14** | **09** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සභාවේ ලේකම් තනතුර සඳහා 2013 වර්ෂයේ සිට රේඛීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු වැඩ බැලීම සඳහා පත්කර තිබූ අතර 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය වන විටත් එම තනතුර සඳහා ස්ථිර ලේකම්වරයෙකු පත් කර නොතිබුණි.